www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනය: රාජපක්ෂ ආර්ථික යුද්ධය වෙනුවෙන් සපථ කරයි

## Sri Lankan election: Rajapakse promises "economic war"

**සසප ජනාධිපති අපේක්ෂක විජේ ඩයස්**

**2010 ජනවාරි 19**

පිටු 100 තරම් දිග "අනාගතය සඳහා දැක්ම" යන ජනාධිපති මහින්ද රාජපක්ෂගේ මැතිවරන ප්‍රකාශනය බොරුවලින් හා බොරු පොරොන්දුවලින් පිරී පවතියි. එහෙත් සත්‍යය හෙළි දක්වන එක් වැදගත් ප්‍රකාශයක් එහි අඩංගු වේ. එනම්, ජය ගන්නේ ඔහු හෝ ඔහුගේ පිළිමල් ජෙනරාල් සරත් ෆොන්සේකා වුවත්, කම්කරු පන්තියට හිමිවනු ඇත්තේ හරියට ම ජනාධිපති දිව්රා සිටින "ආර්ථික යුද්ධයකි."

"ආසියාව තුල හිස ඔසවන විශ්මය" ලෙස ශ්‍රී ලංකාවේ අනාගතය මවා පෙන්වන අතර ම සිය විශිෂ්ඨ ආර්ථික ජයග්‍රහන හුවා දැක්වීමේ දී රාජපක්ෂ "ආර්ථික යුද්ධය" යන පදය යොදා ගනියි. මැතිවරනයෙන් පසුව නිසැකව ම ආර්ථික යුද්ධයක් දියත් වන නමුත් එය රාජපක්ෂ ගොතන ආකාරයේ විශ්මයක් නොවනු ඇත. දහස් ගනන් මරුමුවට පත්වීම, ලක්ෂ ගනනක් අවතැන් වීම, නගර නටඹුන් බවට පත්වීම, අහස උසට නඟින මිල ගනන් ලෙස යුද්ධයේ සියලු බර රාජපක්ෂ විසින් වැඩ කරන ජනතාව මත පැටවූ ආකාරයට ම ව්‍යාපාරික ප්‍රභූ පැලැන්තියේ ලාභය සඳහා කැපකරන ලෙස ඔහු, කම්කරුවන්ට බලකරනු ඇත.

ෆොන්සේකා හෝ රාජපක්ෂ යන කිසිවෙකුත් රටේ මහජනතාව හා ආර්ථිකය මුහුනපා ඇති සැබෑ තත්වය ගැන කථා නොකරති. ෆොන්සේකා සෑම ආර්ථික විනාශයකට ම මුල රාජපක්ෂ තන්ත්‍රයේ දූෂනය බවට චෝදනා නගන අතර ජනාධිපති, කිසිදු ගැටලුවක් කොහේවත්ම ඇති බවක් සරලව ම ප්‍රතික්ෂේප කරයි.

රාජපක්ෂගේ ගනන් හිලව් කොළඹ කොටස් වෙළඳපොලේ ජාවාරම්කරුවන්ගේ ගිනුම් ක්‍රමයන්ට සමානය. ඉතිහාසයේ කවර කලෙකවත් කිසිදු ජාතියක් සිය ඒකජනක ආදායම සිව් වසරක් තුල දෙගුන කරගෙන ඇත්තේ නැත. ගනන් බලා ඇති පරිදි පසුගිය සිව් වසරේ දල දේශීය නිෂ්පාදිතය වාර්ෂිකව වැඩිවී ඇත්තේ යන්තම් සියයට 6 කිනි. රාජපක්ෂ සිය සංඛ්‍යාලේඛන ඇස් බැන්දුම සොයාගෙන ඇත්තේ කෙසේ ද? ඔහු සරලව ම සිය ගනන් හිලව් තුලට 2008 වසරේ සියයට 30 කින් පමන ඉහල නැඟුනු මිල ගනන් රුවා ගනියි. කිලෝග්‍රෑමයක මිල නොකඩවා ඉහල නඟින පලියට ඔබට අතිරේක සහල් ලැබෙන්නේ නැත. ආර්ථික වර්ධනය සම්බන්ධයෙන් ද එසේම ය.

රාජපක්ෂ සිය සංඛ්‍යාලේඛන රටේ මහ බැංකුවෙන් ලබාගත්තේය යන කාරනය සනිටුහන් කරන්නේ, සිවිල් යුද්ධය මගින් දේශපාලන සංස්ථාපිතය මෙන්ම සමස්ත රාජ්‍ය යාන්ත්‍රනය ද දූෂිත වී ඇති තරමයි. බොරු දෙසාබෑම දේශපාලඥයන්ගේ මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ ද දෛනික ජීවිතයේ ම අංගයක්ව තිබේ.

යථාර්තය නම් සිය යුද වියදම් පියවීමට රාජපක්ෂ රට මුලුමනින්ම උකස්කර තිබීමයි. පසුගිය සැප්තැම්බරය වන විට ආන්ඩුවේ නය දල දේශීය නිෂ්පාදිතයෙන් (දදේනි) සියයට 90 තෙක් නැඟී තිබුනි. රාජ්‍ය මූල්‍යය බිඳවැටීමෙන් වැලකී ඇත්තේ ගෙවුම් ශේෂ අර්බුදයක් මඟහරවා ගැනීම පිනිස රාජපක්ෂට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජාමූඅ) ඩොලර් බිලියන 2.6 ක නයක් ලැබීම නිසා පමනි. රාජපක්ෂ කල් තියා මැතිවරනය කැඳවූයේ ආර්ථික තත්වය තවදුරටත් නරක අතට හැරෙන බව දැන සිටින නිසාය. ජාමූඅ නිහඬ අනුමැතිය සහිතව ඔහු, මැතිවරනය අවසන්වන තෙක් සිය ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිවිපාක සැඟවීමේ අරමුනෙන් අයවැයක් ඉදිරිපත් නොකලේය.

මැතිවරන පොරොන්දු ඉටුකිරීමට මුදල් වැයකිරීම කෙසේ වෙතත් මීලඟ ආන්ඩුව පොදු වියදම් තව තවත් කපාහැරීමට පියවර ගනු ඇත. ජාමූඅ සීමාපැනවීම්වල කොටසක් ලෙස අයවැය හිඟය, 2011 වනවිට දදේනි සියයට 4 ක ප්‍රමානයකින් කපාහල යුතුය. එක් අපේක්ෂකයෙකුවත් පොලිසිය හා මිලිටරිය

අඩු කිරීමට පියවර නොගන්නා තතු හමුවේ අරමුදල් මිරිකා ගනු ඇත්තේ නිදහස් අධ්‍යාපනය, මහජන සෞඛ්‍යය, ශුභසාධන හා මිල සහනාධාර වලිනි. දැනටමත් වැටුප් කැටිකිරීමකට ලක්ව සිටින රාජ්‍ය අංශයේ කම්කරුවන් තවදුරටත් කැපකිරීම් ඉල්ලා සිටින තත්වයකට මුහුනදෙනු ඇත. ප්‍රතිව්‍යුහකරනය හා පුද්ගලීකරනය වේගවත් කරනු ඇත. ලැයිස්තුවේ මුලටම ඇත්තේ විදුලි බලය හා ඛනිජ තෙල් අංශය.

රාජපක්ෂ ඔහුගේ මැතිවරන ප්‍රකාශනය අනුව කටයුතු කරනු ඇතැයි සිතන යමෙක් සිහියට නඟාගත යුත්තේ, 2005 මැතිවරනයේදී ඔහු ඉදිරිපත් කල මහින්ද චින්තනය නැත්නම් මහින්ද දැක්ම තුල කඩකර ඇති පොරොන්දු පිලිබඳ ලැයිස්තුවයි. ඔහු සාමය පොරොන්දු වෙමින් ඒ වෙනුවට රට යලි වතාවක් මෘග වාර්ගික යුද්ධයකට ඇද දැමීය. තරුනයන්ට රැකියා පොරොන්දු වෙමින් ඔහු ඒ වෙනුවට ඔවුන් මරනය කරා දැක්කීය. ජීවන තත්වයන් ද අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවය වැනි සේවාවන් නඟාසිටුවන බවට කල ඔහුගේ සියලු ප්‍රකාශ ප්‍රෝඩාවන් බව ඔප්පුවී තිබේ. ජීවන වියදම අහස උසට නැඟී තිබේ. දරිද්‍රතා මට්ටම් ඉහල ගොස් තිබේ. පසුගිය මැයි මාසයේදී ඔහු සිය "ආර්ථික යුද්ධය" මෙසේ අර්ථ දැක්වීය. "අපගේ වීරෝදාර රනවිරුවෝ සම්පූර්න වසර තුනක් තිස්සේ පැය අටක් නොව දවසේ පැය විසිහතරම රාජකාරියේ නිරතවූහ." ඔහු කම්කරුවන්ට කියා සිටියේ ඔවුන්ගේ කැපවීම් සිහියට නඟා ගන්නා ලෙසත්, "වැඩකල පැය ගනන ගනන් කරමින් නොසිට" ඔවුන් ආදර්ශයට ගන්නා ලෙසත් ය.

සිව් වසරක් පුරා රාජපක්ෂ, සියලු වෘත්තීය සමිතිවල ද සහයෝගය ඇතිව සාධාරන වැටුප් හා සේවා කොන්දේසි සඳහා කම්කරුවන්ගේ ඉතාමත් සීමිත ඉල්ලීම් පවා පාගා දැමීය. වැඩ වර්ජනය කල කම්කරුවන්ට ඔහු යලි යලිත් චෝදනා කලේ යුද ව්‍යායාමය කඩාකප්පල් කරමින් එල්ටීටීඊයට ආධාර කරන බවට ය. ඔහු වැඩවර්ජන බිඳ දැමීම සඳහා මිලිටරිය හා පොලිසිය යෙදවීය. පසුගිය වසර අවසානයේ ජනාධිපති සිය හදිසි නීති බලතල යොදාගනිමින් වරාය, විදුලිබල, ඛනිජ තෙල් හා ජලසම්පාදන මන්ඩලයේ කම්කරුවන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග තහනම් කලේය.

මැතිවරනයේදී රාජපක්ෂ හෝ ෆොන්සේකා යන කවරෙකු ජයග්‍රහනය කලත් වැඩකරන ජනතාවට එරෙහි නව ආර්ථික යුද්ධයේ දී, එල්ටීටීඊයට එරෙහිව ගෙන ගිය යුද්ධයේ දී වර්ධනය කල එම පොලිස්-රාජ්‍ය ක්‍රමෝපායන්ම යොදාගන්නවා ඇත. පොලිසියේ හා මිලිටරියේ විශාලත්වය එසේම පවත්වා ගෙන යන්නේත්, හදිසි නීතිය හා අනෙකුත් මර්දනකාරී අනපනත් එසේම තබා ඇත්තේත් එබැවින්ය.

ශ්‍රී ලංකාව "ආසියාවේ විශ්මය" බවට පරිවර්තනය කිරීමේ රාජපක්ෂගේ සැලසුමෙන් අරමුනු කොට ඇත්තේ, සාමාන්‍ය වැඩකරන ජනතාව නොව මහා ව්‍යාපාර හා විදේශ ප්‍රාග්ධනය සඳහා වෙලඳපොලකි. දිවයින සියලු දෙයෙහි කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට ඔහු පොරොන්දු වෙයි. "අපගේ මාතෘ භූමිය නාවික, ගුවන්, වෙලඳ, බලශක්ති හා ඥානයේ කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට උපකාරී වන, නැඟෙනහිර හා බටහිර අතර පුරුකක් බවට පත්කල යුතුය." නව වරායන්, නව ජාත්‍යන්තර ගුවන් තොටුපලක්, මුහුදේ තෙල් ලිං ඉදිකිරීම හා "ආසියාවේ ප්‍රමුඛ වෙලඳ මධ්‍යස්ථානයක්" බවට දිවයින පත්කිරීමට ඔහු ප්‍රතිඥා දෙයි.

මේතාක් දුරට මෙම මහා ව්‍යාපෘතිය මුලුමනින්ම මන්ස්ගාතයක් නොවේ. දිවයින තුලට විදේශ ප්‍රාග්ධනය හා ආධාර ඇද ගත හැකි පරිදි හා රටේ ව්‍යාපාරවලට ලොකු ලාභ ලැබෙන පරිදි, වර්ධනය වන ජාත්‍යන්තර එදිරිවාදිකම්, විශේෂයෙන්ම එක්සත් ජනපදය හා චීනය අතර, උපයෝගීකර ගැනීමට රාජපක්ෂ බලාපොරොත්තු වෙයි. ඔහුගේ නවතම "දැක්ම" නොකඩවා ලාභ ශ්‍රම සම්පාදනය සහතික කලහැකි පරිදි කම්කරුවන්ගේ සමාජ තත්වයන් මත දුරදිග යන ප්‍රහාරයක් ඇඟවුම් කරයි. දිවයින, මහා බලවතුන් අතර තරඟය හා ගැටුම් තුලට ඇදී යාමක් ද එයින් අදහස් කෙරේ.

මේ සියලු සැලසුම් ගොඩනැඟෙන්නේ දුබල අත්තිවාරම් මතය. රට තුලත් ජාත්‍යන්තරවත් මාධ්‍ය විසින් පතුරුවා හරින මිත්‍යාවන්ට පටහැනි ලෙස, ගෝලීය ආර්ථික අර්බුදය අවසන්ව නැත. එය තවමත් ආරම්භවුනා පමනි. බැංකුවලට හා මහා සංගතයන්ට ඇපදීමේ ඩොලර් ට්‍රිලියන ගනන් වලින් සැදුම්ලත් දැවැන්ත ක්‍රියාවලියක් සමඟ දැන් පෙනෙන්නට ඇති සමතුලිතය මිලට ගෙන තිබේ. දැනටමත් ප්‍රධාන නය අර්බුදයක් පැනනැඟී තිබෙන ග්‍රීසිය හා අයර්ලන්තය වැනි රටවල්, ඒවායේ බරට කරගැසීමට වැඩ කරන ජනතාවට බලකෙරෙන රුදුරු අයවැය ලේඛන ඉදිරිපත්කොට ඇත.

මෙම ආර්ථික කුනාටුවලට ඔරොත්තු දීම කෙසේ වෙතත්, විශේෂයෙන්ම ශ්‍රී ලංකාව එයට ගොදුරුවන තැනක පවතියි. දස දහස් ගනන් රැකියා විනාශවීමට තුඩු දෙමින් ගෝලීය ආර්ථික පසුබෑම එහි සියලු නිර්යාත කර්මාන්ත බිඳහෙලා තිබේ. මේ දක්වා මෙරට කම්කරුවන්ගේ ප්‍රේෂනයන්ට බලපෑමක් ඇතිවී නැත. එහෙත් ආර්ථික කලබැගෑනිය මැද පෙරදිගට කඩාවදින විට මේ තත්වය වේගයෙන් වෙනස්වනු ඇත. වෙනත් තැන්වල ආන්ඩු මෙන්ම ඊලඟ ජනාධිපති ද බංකොලොත් ධනේශ්වර පද්ධතියට මුක්කුව දීම

සඳහා කම්කරු පන්තිය කැපකර ගැනීමට නොපසුබට වනු ඇත.

තවත් එක් අනතුරු ඇඟවීමක් කිරීම අවශ්‍යය. එල්ටීටීඊ පරාජයෙන් පසුව ෆොන්සේකා හා රාජපක්ෂ ප්‍රකාශ කලේ, සියලු ජනවර්ගයන්ට සහයෝගයෙන් ජීවත්විය හැකිවන පරිදි ඔවුන් "වාර්ගික ගැටලුව" නිරාකරනය කරන බවය. ඔවුන්ගේ අනෙකුත් පොරොන්දු මෙන්ම එය ද පචයකි. මේ පුද්ගලයන් දෙදෙනාම, බිහිසුනු යුද අපරාධවලට, දෙමල සිවිල් වැසියන් දෙලක්ෂ පනස්දහසක් සිරගත කිරීමට හා තවත් වාර්ගික ආතතීන් හා ගැටුම්වල තර්ජනය මතුකරන, උතුරේ හා නැගෙනහිර මිලිටරි වාඩිලෑමට වගකිව යුතුය. දෙමල දේශපාලඥයන් සමඟ ඇයි හොඳයිය මඟින් මාතෘභූමිය පාවාදෙන බවට මැතිවරන ව්‍යාපාරය තුලදී එකිනෙකාට චෝදනාකර ගැනීම මඟින් ඔවුහු, හිතාමතාම ස්වෝත්තමවාදී ආවේගයන් උසිගන්වති.

වැඩකරන ජනතාව ශේෂ පත්‍රයක් සකසාගත යුතුය. පිලිකුල කෝපය හා අපේක්ෂා භංගය පමනක් සෑහෙන්නේ නැත. රාජපක්ෂ හෝ ෆොන්සේකා යන කවරෙකු බලයට පත් වුවත් කම්කරුවන් මුහුන දෙන්නේ, ජීවන තත්වයන් මත බරපතල ප්‍රහාර, පොලිස්-රාජ්‍ය සැලසුම් හා කම්කරු පන්තිය බෙදීම සඳහා ප්‍රචන්ඩත්වය හා වාර්ගික ආතතීන් ඇවිස්සීම යන සැබෑ අන්තරායන්ට ය. මේ සියල්ල සලකුනු කරන්නේ ශ්‍රී ලංකා ධනේශ්වරයේ පරිපූර්න දේශපාලන බංකොලොත් කමයි. දශක හයකටත් වැඩි කාලයක් තිස්සේ වැඩ කරන ජනතාවගේ මූලික සමාජ අවශ්‍යතා හා ප්‍රජාතන්ත්‍රීය අපේක්ෂාවන් සාක්ෂාත් කිරීමට ඔවුන් අපොහොසත්ව ඇත.

සූදානම් කෙරෙමින් තිබෙන ප්‍රහාරයට මුහුනදීමට කම්කරු පන්තියට හැකි වන්නේ පාලක පන්තියේ සියලු කොටස් වෙතින් ස්වාධීනව තමන්ගේ ම දේශපාලන බලමුලු ගැන්වීම සූදානම් කිරීම තුලින් පමනි. ජනාධිපති රාජපක්ෂ හෝ ජනාධිපති ෆොන්සේකාට එරෙහිව, ජාත්‍යන්තරවත් දකුනු ආසියාවේත් සමාජවාදය සඳහා අරගලයේ කොටසක් ලෙස සමාජවාදී ප්‍රතිපත්ති ක්‍රියාවට නඟන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් පිලිබඳ සටන්පාඨය නැංවිය යුතුය. අපගේ ව්‍යාපාරයට සහයෝගය දෙන ලෙස අපි ඔබගෙන් ඉල්ලා සිටිමු.

© www.wsws.org